# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1994/46 - 2016 නොවැම්බර් මස 23 වැනි බදාදා - 2016.11.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමුව* : DIK/LAN/02/30/41.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තේගම උතුර ග්‍රාම නිලධාරි වසමේ වත්තේගම ගමේ පිහිටි මාතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක මූ.පි. මාර 2677 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස් :

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: කොල්ලන්මාරුව; විස්තරය : ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය : කේ. කේ. සරත් අනඳප්‍රිය, අංක 43 බී, නවනගරය, කතරගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0133.

**02. කැබලි අංක 02**

ඉඩමේ නම: වෙදගෙදරවත්ත; විස්තරය : ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: එම්. එච්. ටී. ඉන්ද්‍රානි, වෙදගෙදරවත්ත, කොල්ලන්මාරුව, වත්තේගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0190.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 දෙසැම්බර් මස 28 වැනි දින පෙ. ව. 10.30ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 දෙසැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් / පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතව ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. එස්. රන්ජිත,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
දික්වැල්ල.

2016 නොවැම්බර් මස 21 වැනි දින,<br>
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 396